DOI: 10.31357/fhssphd.2013.00075

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දර්ශනසූරි උපාධිය සඳහා
ඉදිරිපත් කරනු ලබන පර්යේෂණ නිබන්ධය

# ජෛන උත්තරාධ්‍යයනය පිළිබඳ සාහිත්‍යාත්මක හා වාග්විද්‍යාත්මක අධ්‍යයනයක්

30 AUG 2013

සංජීව විජිත කුමාර

දර්ශනසූරි 2013

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දර්ශනසූරි උපාධිය සඳහා
ඉදිරිපත් කරනු ලබන පර්යේෂණ නිබන්ධය

# ජෛන උත්තරාධ්‍යයනය පිළිබඳ සාහිත්‍යාත්මක හා වාග්විද්‍යාත්මක අධ්‍යයනයක්


නම : වැඋඩයලෑ ගෙදර සංජීව විජිත කුමාර

ශාස්ත්‍රවේදී (විශේෂ) පාලි, ප්‍රථම පන්තිය, ශ්‍රී ජයවර්ධනපුර, 2008.

ශාස්ත්‍රපති (පාලි - In English) කැලණිය , 2008.

ශාස්ත්‍රපති, (බෞද්ධ අධ්‍යයන) බෞද්ධ හා පාලි, 2007.

ප්‍රාචීන පණ්ඩිත, ප්‍රාචීන භාෂොපකාර සමාගම, 2004.

අධ්‍යයනාංශය : පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය



ලේඛනාරූඪ අංකය : GS/PhD/PA/1307HU2010002

විෂයය : පාලි

වර්ෂය : 2013 අගෝස්තු



පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

ගංගොඩවිල, නුගේගොඩ.

# ප්‍රකාශය

මෙම ශාස්ත්‍රීය නිබන්ධය, අභ්‍යන්තර උපදේශක, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආචාර්ය, පූජ්‍යපාද මාගම්මන පඤ්ඤානන්ද හිමිපාණන් වහන්සේගේ හා බාහිර පර්යේෂණ උපදේශක, සම්මානිත මහාචාර්ය, ඔලිවර් අබේනායක මැතිතුමාගේ සදුපදේශයෙන්, පුස්තකාල අධ්‍යයනය තුළින් දත්ත රැස් කිරීමෙන්, මවිසින් ස්වෝත්සාහයෙන් ම කරනු ලැබුවකි. මෙය මෙම විශ්වවිද්‍යාලයට හෝ වෙනත් විශ්වවිද්‍යාලයකට හෝ වෙනත් අධ්‍යාපන ආයතනයකට හෝ ඉදිරිපත් කළ නිබන්ධයක් හෝ නිබන්ධයක කොටසක් හෝ නො වේ. මෙහි අඩංගු සියලු කරුණු සඳහන් කිරීමකින් තොරව ඇතුළත් කොට නැති බවත්, මාගේ උපරිම දැනුම හා විශ්වාසය අනුව වෙනත් කිසිදු කෙනකු විසින් මීට පෙර ලියන ලද හෝ මුද්‍රණය කරන ලද හෝ කිසි ම කරුණක් කෘතියෙහි නියමිත සඳහනකින් තොරව ඇතුළත් කොට නොමැති බවත් පරීක්ෂකවරුන් විසින් පෙන්වාදුන් සංශෝධන සකස්කොට ඉදිරිපත් කරන බවත් මෙයින් සහතික කරමි.

මෙයට,



...............................

පර්යේෂක,

ඩබ්. ජී. එස්. විජිත කුමාර

GS/PhD/PA/1307HU2010002

## උපදේශකවරුන්ගේ නිර්දේශය

වැඩයලැ ගෙදර සංජීව විජිත කුමාර විසින් දර්ශනසූරි උපාධි අවශ්‍යතාව සඳහා **ජෛන උත්තරාධ්‍යයනය පිළිබඳ සාහිත්‍යාත්මක හා වාග්විද්‍යාත්මක අධ්‍යයනයක්** යන ප්‍රස්තුතය යටතේ ලියා ඇති මෙම නිබන්ධයෙහි, පරීක්‍ෂකවරුන් විසින් පෙන්වාදුන් සංශෝධන සකස්කොට ඇතිබවත් දර්ශනසූරි උපාධිය සඳහා උචිත ලෙස සම්පාදනය කර ඇති බවත්, මෙය ඒ සඳහා සුදුසු බවත් නිර්දේශ කරමි.

01. අභ්‍යන්තර උපදේශක :

..........................................................

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආචාර්ය, මාගම්මන පඤ්ඤානන්ද හිමිපාණෝ

අධ්‍යයනාංශ ප්‍රධාන,
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
ගංගොඩවිල, නුගේගොඩ.

02. බාහිර පර්යේෂණ උපදේශක :

..........................................................

සම්මානිත මහාචාර්ය, ඔලිවර් අබේනායක මහතා

# ජෛන උත්තරාධ්‍යයනය පිළිබඳ සාහිත්‍යාත්මක හා වාග්විද්‍යාත්මක අධ්‍යයනයක්

## පිදුම

මග නො මග කියාදී

සිප් සතර දායාද කළ

ගිහි පැවිදි ගුරු දෙගුරුන්ට...

# පටුන


මාතෘකා පිටුව

ප්‍රකාශය ii

උපදේශකවරුන්ගේ නිර්දේශය iii

පටුන v - viii

උපකාරානුස්මෘතිය ix

සාර සංක්ෂේපය x - xi

හැකුළුම් xii - xv

**1. පළමු පරිච්ඡේදය**

**හැඳින්වීම** **1 - 30**

1.1 ප්‍රවේශය 1 - 2

1.2 නිගණ්ඨ නාතපුත්තගේ පහළවීම 2 - 7

1.3 බුද්ධ චරිතය හා ජෛන දහම 8 - 18

1.4 බෞද්ධ ශ්‍රාවක ශ්‍රාවිකා චරිත හා ජෛන ඉගැන්වීම් 18 - 20

1.5 ආගමික හා දාර්ශනික සංකල්ප 21 - 30

**2. දෙවන පරිච්ඡේදය**

**උත්තරාධ්‍යනයෙහි භාෂාව හා අන්තර්ගතය** **31 - 67**

2.1 ප්‍රවේශය 31 - 33

2.2 ප්‍රාකෘත නිර්වචනය 34 - 39

2.3 ප්‍රාකෘත භාෂාව හඳුනාගැනීම 39 - 44

2.3.1 භූගෝලීය සාධක 39

2.3.2 සමාජයීය සාධක 40

2.3.2 භාෂාත්මක සාධක 40 - 44

| | | |
|---|---|---|
| 2.4 | පැරණි ම ප්‍රාකෘතය කුමක් ද යන ගැටලුව | 44 - 51 |
| 2.5 | ජෛන ආගමික ග්‍රන්ථ සාහිත්‍යය | 51 - 58 |
| 2.6 | උත්තරාධ්‍යයනයෙහි අන්තර්ගතය | 59 - 67 |
| 2.6.1 | උත්තරාධ්‍යයන මූල සාහිත්‍යය | 59 |
| 2.6.2 | උත්තරාධ්‍යයන පර්යේෂණ සාහිත්‍යය | 59 - 63 |
| 2.6.3 | උත්තරාධ්‍යයනයේ සංයුතිය | 63 - 66 |
| 2.6.4 | උත්තරාධ්‍යයනයෙහි කාලනිර්ණය | 66 -67 |

**3. තෙවන පරිච්ඡේදය**

| | | |
|---|---|---|
| | **උත්තරාධ්‍යයනයෙහි භාවිත සාහිත්‍ය අංග** | **68 - 105** |
| 3.1 | සාහිත්‍යයෙහි වපසරිය | 68 - 70 |
| 3.2 | ආඛ්‍යාන භාවිතය | 70 - 97 |
| 3.3 | නාට්‍යමය ආකෘතීන් | 97 - 102 |
| 3.4 | වංසකතා ලක්ෂණ | 102 - 104 |
| 3.5 | අට්ඨකථා ලක්ෂණ | 104 - 105 |

**4. සිවුවන පරිච්ඡේදය**

| | | |
|---|---|---|
| | **උත්තරාධ්‍යයනාගත සාහිත්‍යාත්මක ලක්ෂණ** | **106 - 147** |
| 4.1 | සාහිත්‍යය පිළිබඳ අර්ථකථන | 106 - 112 |
| 4.2 | උත්තරාධ්‍යානයෙහි සාහිත්‍යාත්මක ලක්ෂණ | 113 - 144 |
| 4.2.1 | ශබ්දාලංකාර භාවිතය | 114 - 119 |
| 4.2.2 | අර්ථාලංකාර | 119 - 130 |
| 4.2.2.1 | උත්තරාධ්‍යයනයේ උපමා භාවිතය | 120 - 130 |
| 4.2.2.1.1 | ආචාරවිද්‍යාත්මක ඉගැන්වීම් තුළ පිළිබිඹු වන උපමා | 120 - 122 |
| 4.2.2.1.2 | දාර්ශනික අදහස් පිළිබිඹු වන උපමා | 122 - 124 |

4.2.2.1.3 භික්ෂු විනය හා බැඳි උපමා 124 - 126

4.2.2.1.4 ලෞකික උපමා 126

4.2.2.1.5 අධිභෞතික උපමා 127

4.2.2.2 රූපකාලංකාර භාවිතය 127 - 129

4.2.2.3 අතිශයෝක්ත්‍යලංකාරය 129 - 130

4.2.2.4 රසභාව භාවිතය 130 - 133

4.2.2.5 සමකාලීන සාහිත්‍යය හා උත්තරාධ්‍යානය 133 - 144

4.2.2.5.1 භාෂා පදයෝජන වශයෙන් ප්‍රකට වන සමානතා 134 - 136

4.2.2.5.2 විනය හෝ ධර්මමය ඉගැන්වීම් වශයෙන් 137 - 140

4.2.2.5.2.1 විනය උපදේශ 137 - 138

4.2.2.5.2.2 ධර්ම උපදේශ 138 - 140

4.2.2.5.3 කතා හා චරිත වශයෙන් ප්‍රකට සමානතා 140 - 142

4.2.2.5.4 සාහිත්‍ය සංකල්ප වශයෙන් 143 - 144

4.3 මහා සම්ප්‍රදායක ලක්ෂණ 145 - 147

**5. පරිච්ඡේදය**

**උත්තරාධ්‍යයනයෙහි වාග්විද්‍යාත්මක අගය 148 - 179**

5.1 තුලනාත්මක වාග්විද්‍යාව හඳුනාගැනීම 148 - 152

5.1.1 වාග්විද්‍යාවේ ස්වභාවය 148 - 149

5.1.2 වාග්විද්‍යාවේ ඉතිහාසය 149 - 151

5.1.3 උත්තරාධ්‍යයනය හා බැඳුණු වාග්විද්‍යාත්මක අගය 151 - 152

5.2 ස්වර අක්ෂර නිරූපණය 152 - 164

5.2.1 ස්වර ප්‍රවර්තන 152 - 153

5.2.2 ස්වර විපර්යාසය 153 - 159

5.2.3. වෘද්ධි වීම 159 - 160

5.2.4 ස්වර සංකෝචන 160 - 163

5.2.5 හ්‍රස්ව ස්වර දීර්ඝ වීම 163

5.2.6 ස්වර විපර්යාසය හෙවත් අභිශ්‍රැති (Umlut) 163

5.2.7 ස්වර විප්‍රකර්ෂය (ස්වර භක්තිය) 163 - 164

5.3 ව්‍යඤ්ජන අක්ෂර නිරූපණය 164 - 171

5.3.1 කේවල ව්‍යඤ්ජන නියෝජනය 164 - 170

5.3.2 කේවල ව්‍යඤ්ජන හායනය 170 - 171

5.4 සංයුක්ත ව්‍යඤ්ජන නිරූපණය 171 - 179

5.4.1 විකල්ප ව්‍යඤ්ජන 172 - 176

5.4.2 පූර්වරූප සමීකරණය 176 - 178

5.4.3 පරරූප සමීකරණ 178 - 179

නිගමනය 180 - 184

ආශ්‍රිත ග්‍රන්ථ 185 - 195

උපග්‍රන්ථ 196 - 206

# උපකාරානුස්මෘති

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දර්ශනසූරි පාලි උපාධි පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරනු ලබන **ජෛන උත්තරාධ්‍යයනය පිළිබඳ සාහිත්‍යාත්මක හා වාග්විද්‍යාත්මක අධ්‍යයනයක්** යන මාතෘකාව යටතේ පර්යේෂණ කටයුතු සිදුකිරීමේ දී අතහිත දුන් පිරිස බොහෝ වෙති. මෙහි ලා ප්‍රථමයෙන් ම මා මෙලොවට බිහිකොට හැදූ වැඩූ දෙමවුපියන් කෘතගුණ පූර්වක ව සෙනෙහසින් සිහිපත් කරමි. එමෙන් ම ශාස්ත්‍රීය ලෝකය ආලෝකවත් කරමින් කුඩා කල පටන් අකුරට නෙත සිත යොමු කළ පූජ්‍ය මහගල්කඩවල පියනන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේට දීර්ඝායුෂ ප්‍රාර්ථනා කරමින් තුති පුදනු කැමැත්තෙමි.

ශාස්ත්‍රීය ලෝකය පිළිබඳ සැලකීමේ දී මෙම නිබන්ධය සඳහා උපදේශකත්වය උසුලමින් අවවාද අනුශාසනා හා දිරිගැන්වීම් කළ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙහි පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ අංශාධිපති ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආචාර්ය පූජ්‍ය මාගම්මන පඤ්ඤානන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේටත්, බාහිර පර්යේෂණ උපදේශක වශයෙන් නිරන්තරයෙන් මගපෙන්වමින් දිරිගැන් වූ සම්මානිත මහාචාර්ය ඔලිවර් අබේනායක මහැදුරුතුමාටත් හද බැතියෙන් කෘතඥතාව පළකරමි. මෙබඳු පර්යේෂණ කාර්යයකට මූලබීජ සැපයූ මහාචාර්ය පූජ්‍ය නායිම්බල ධම්මදස්සි ස්වාමීන්ද්‍රයන් වහන්සේට ද තත් පර්යේෂණ කාර්යය කෙටිකලක දී සම්පූර්ණ කර ගැනීම සඳහා නිරතුරු ව අවශ්‍ය කටයුතු සලසා දුන් මහාචාර්ය ඥානදාස පෙරේරා ඇදුරුතුමන් ද ගෞරවයෙන් සිහිපත් කළයුතු ම ය. එමෙන් ම උක්ත අධ්‍යයනාංශයේ ආචාර්ය මණ්ඩලයේ සියලු පැවිදි හා ගිහි ආචාර්යවරුනුත් මා හා මිත්‍රත්වයෙන් නිරන්තරයෙන් කටයුතු කරන මිතුරු කැළත් සෙනෙහසින් සිහිපත් කරමි.

මෙවැනි මානසික වෙහෙස ද, පීඩනය ද දරා ගනිමින් කළයුතු ශාස්ත්‍රීය කර්තව්‍යයක දී ලැබිය යුතු කායික හා මානසික සෞඛ්‍ය පහසුව සපයමින් නිරතුරුව මා දිරිමත් කළ මාක්ස් ධම්මිකා ජයමිණි පතිරාජ වන මාගේ සෙනෙහෙබර බිරිඳ ද ආදරයෙන් සිහිපත් කරමි.

ශාස්ත්‍රීය කටයුතු සඳහා සෑම අවස්ථාවක ම නො පැකිළ ව සහයෝගය ලබාදෙන කුමාරි විජේවර්ධනයන්ට ද, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයේ තුෂාර මහතා ඇතුළු සියලු නිලධාරීන්ට ද හෘදයාංගම කෘතඥතාව පළකරනු කැමැත්තෙමි.

# සාර සංක්ෂේපය

ආගම හා සාහිත්‍යය යනු එකිනෙකට බැඳි ප්‍රවාහයන් දෙකකි. ඔවුනොවුන් අන්තර්යාමීය වශයෙන් යැපෙන බව ප්‍රත්‍යක්ෂ සත්‍යයකි. එය ඕනෑම ආගමකට ආදේශ කළ හැකි සහ කළ යුතු ධර්මතාවක් වන අතර බුද්ධදහමට බෞද්ධ සාහිත්‍යය ද, ජෛන ආගමට ජෛන සාහිත්‍යය ද වශයෙන් ගැනීම අපගේ ප්‍රස්තුතයට අදාළ ව උචිත වේ. ජෛන සාහිත්‍යයේ මූලික ආගමික කෘති 45 ක් වේ. ඒවා අතර ජෛන මහාවීර හෙවත් නිගණ්ඨ නාතපුත්ත විසින් ද එතුමන්ට ප්‍රථමයෙන් ජීවත් වූ ශාස්තෘවරුන් විසින් දේශනා කළ දේශනාවන් ද හඳුනාගත හැකි වේ. එහි ලා තරමක් ව්‍යාකූල පසුබිමක් කාල නිර්ණයට ගොඩනැගෙන්නේ ඔවුන් මුඛ පරම්පරාවෙන් ධර්මය ක්‍රි.ව. 10 වන ශතවර්ෂය දක්වා රැගෙන ඒමයි. නමුත් එපමණකින් ඔවුන්ගේ ධර්ම සාහිත්‍යය ප්‍රතික්ෂේප කිරීම හෝ අවතක්සේරුවට ලක්කළ යුතු නො වේ. එම ධර්ම සාහිත්‍යයෙහි මූල සූත්‍ර 4 ක් වේ. ඒවායින් එකක් ලෙස උත්තරාධ්‍යයනය සලකනු ලැබේ. මෙහි මුල් අවස්ථාවේ අභ්‍යන්තර සූත්‍ර 54 ක් වූ බවත් නමුත් වර්තමානයෙහි එය 36 කට සීමා වී ඇති බවක් දැක්වේ. ඇතැමෙක් මෙය මහාවීරගේ අවසාන දේශනය ලෙස සලකතත් සියලු ම අභ්‍යන්තර සූත්‍ර මහාවීර විසින් දේශනා කළ බවක් තත් දේශනා තුළ හෝ වෙනත් කිසිදු ස්ථානයක දක්නට නො ලැබේ. එයින් ප්‍රකාශ වන්නේ මහාවීරගේ දේශනා මෙහි නොමැති බව නො වේ. මහාවීරගේ දේශනා මෙන් ම ඊට පැරණි ඉගැන්වීම් ද මෙහි අන්තර්ගත ව ඇති බව පැහැදිලි ය.

මෙම උත්තරාධ්‍යනයෙහි එන ඉගැන්වීම් සාම්ප්‍රදායික ව බෞද්ධ සාහිත්‍ය තුළ ජෛන ආගම සහ සාහිත්‍යය පිළිබඳ ගොඩනගා ඇති මතවාද සමග තරමක් විසංවාදී තත්ත්වයක් මතුකරයි. ඇතැම් අවස්ථාවල බුද්ධදහම හා අතිශය සමගාමී ඉගැන්වීම් ඉදිරිපත් කරන උත්තරාධ්‍යයනය සිද්ධාර්ථ බෝධිසත්ත්වයන්ට ද බුද්ධ චරිතයට ද බෞද්ධ භික්ෂු සමාජයට ද ඓතිහාසික බුද්ධ සංකල්පයට ද කිසියම් බලපෑමක් කළ බව අභ්‍යන්තරයෙහි එන ආගමික, දාර්ශනික, සාහිත්‍යාත්මක හා භාෂාත්මක සංකල්පයන් විමර්ශනාත්මක ව අධ්‍යයනය කිරීමෙන් පැහැදිලි වේ.

අපගේ පර්යේෂණයෙන් උත්තරාධ්‍යනයෙහි සාහිත්‍යාත්මක සංකල්ප ඉලක්ක කළ අතර ඒ හා සමගාමී ව එහි උපයුක්ත ව ඇති භාෂා භාවිතය පිළිබඳ ව ද අවධානය යොමුකරනු ලැබිණි. මෙම සාහිත්‍යාත්මක වාග්විද්‍යාත්මක අධ්‍යයනය තුළ පාලි ත්‍රිපිටකයටත් ඒ හා බැඳුණු බෞද්ධ සාහිත්‍යයටත් ආගමික, දාර්ශනික හා චරිතමය වශයෙන් කෙතරම් සමීපතාවක් ප්‍රකට කරන්නේද යන්න අධ්‍යයනයට ලක්විණි. ඇතැම් අවස්ථාවක බෞද්ධ සාහිත්‍යාගත කථා මූලබීජ හා උපදේශාත්මක ප්‍රකාශ ජෛන සාහිත්‍යයෙන් ණයට ගත් බවක් පිළිබිඹු වේ. තවත් අවස්ථාවක බුද්ධ චරිතය ඇතුළු බොහෝ බෞද්ධ ඓතිහාසික චරිත ජෛන ශාසනයේ ඉතිහාසයේ බලපෑමට ලක් වූ බවක් පෙනේ. එයින් ගම්‍ය වන්නේ බුදුදහම ජෛන ආගමේ ශාඛාවක් බව නො වේ. කෙසේ වෙතත් ජෛන ආගම හා බුදුදහම එක ම මූලයකින් ප්‍රභවය වූ දාර්ශනික හා සාමාජයීය මෙන් ම සංස්කෘතිකමය වශයෙන් පමණක් සුළු සුළු වෙනස්කම් සහිත සම්ප්‍රදායයන් දෙකක් බව මෙම පර්යේෂණයෙන් අවධාරණය කරනු ලැබේ.

# හැකුළුම්

| | |
|---|---|
| ACD | A Comparative Dhammapada |
| AG | Ardhamagadhi Grammar |
| AGPL | A Grammar of the Prakrit Language |
| AMR | Ardha-Magadhi Reader |
| ATHATKN | A Textual and Historical Analysis of The Khuddaka Nikaya |
| BDBSL | Bodhisatva Doctrine of Buddhist Sanskrit Literature |
| BS | Buddhistic Studies |
| CHI | The Cultural Heritage of India |
| CSCD | Chattha Sangayana Compact Driver |
| CSJB | Comparative Study of Jainism and Buddhism |
| CoP | Collected Papers |
| DJ | Doctrine of Jainism |
| DNATI | Digha Nikaya Abhinava Tika |
| HCLJ | History of Canonical Literature of Jainism |
| HIL | History of Indian Literature |
| HJM | History of Jain Monachism |
| IP | Introduction to Prakrit |
| JP | Jain Pilosopy |
| MY | Myanmar |
| NJ | Narratives of Jainism |
| PD | Prakrit Dhammapada |
| PED | Pali English Dictionary |

| | |
|---|---|
| PLL | Pali Language Literature |
| PSED | Practical  Sanskrit English Dictionary |
| SED | Sanskrit English Dictionary |
| SJCS | Some Jain Canonical Sutra |
| TEFA | The Early Faith of Asoka |
| Uttar | Uttaradhyayana |
| Uttar –trans | Uttaradhyayana Translation |
| අංනි | අංගුත්තරනිකාය |
| අඉ | අසිරිමත් ඉන්දියාව |
| අත්‍ථ | අත්‍ථසාලිනී |
| අපදා | අපදාන පාළි |
| ඉඉ | ඉන්දීය ඉතිහාසය |
| උත් | උත්තරාධ්‍යයන |
| උදා | උදාන පාළි |
| උදාඅ | උදාන අට්ඨකතා |
| ඍග් | ඍග්වේද |
| කලා | කලාව යනු කුමක්ද |
| කාව්‍යානු | කාව්‍යානුශාසන |
| කාව්‍යා | කාව්‍යාදර්ශය |
| කාවිමූ | කාව්‍ය විචාර මූලධර්ම |
| කෙවිමූස | කෙටිකතා විචාර මූලධර්ම සම්ප්‍රදාය |
| ඛුනි | ඛුද්දකනිකාය |
| චරියා | චරියාපිටක පාළි |
| චුල්ල | චුල්ලවග්ග පාළි |
| ජා | ජාතක පාළි |
| ජාඅ | ජාතක අට්ඨකතා |